## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ජනාධිපති ලේකම්තුමා,
අග්‍රාමාත්‍ය ලේකම්තුමා,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරු,
ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,

**ජනාධිපතිවරණය - 2024**
***රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ක්‍රියාත්මකවීම පිළිබඳ නියමයන්***

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 ව්‍යවස්ථාව අනුව ජනරජයෙන් වැටුප් ලබන නිලධාරීන් "රාජ්‍ය නිලධාරීන්" ලෙස අර්ථකථනය කර ඇත. එය දණ්ඩ නීති සංග්‍රහයේ 19 වන වගන්තිය තුළින් ද වැඩිදුරටත් පැහැදිලි කෙරේ. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව ප්‍රකාරව සියලුම රාජ්‍ය නිලධාරීන් ව්‍යවස්ථාවේ ඇතුලත්කර ඇති මානව හිමිකම්වලට ගරු කිරීමට හා ආරක්ෂා කිරීමට බැදි සිටී. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වන සංශෝධනය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කරන බවට සියලුම රාජ්‍ය නිලධාරීන් දිවුරුම් දී ඇති. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව අනුව සියලු දෙනාම නීතිය ඉදිරියේ සමාන වන අතර නීතිය ක්‍රියාත්මක වීම හා නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතුය.

ඡන්දය දැමීමට ඇති අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තහවුරු කර ඇත. මේ අනුව ඡන්ද විමසුමක් පවත්වන අවස්ථාවක, පවත්නා මැතිවරණය රටේ පවතින අනෙකුත් නීති හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීමට රාජ්‍ය නිලධාරීන් බැදි සිටින අතර, ඒ ඒ වගකීම් දරණ රාජ්‍ය නිලධාරීන් එකී නීතිවලට අනුකූලව සාධාරණ හා අපක්ෂපාතිව තම රාජකාරි කටයුතු ක්‍රියාත්මක කළයුතුව ඇත.

රාජ්‍ය නිලධාරීන් බැදි සිටින නීතිමය වගකීමක් අයුතු ලෙස යොදා ගැනීම හෝ නීතිමය සීමාව ඉක්මවා ක්‍රියා කිරීම මෙන්ම කළයුතු කාර්යයන් නොකර සිටීම ද, සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හැරීම ද අනවශ්‍ය ලෙස ප්‍රමාද කිරීමද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වේ. ඒ අනුව රාජ්‍ය නිලධාරීන් විසින් එවැනි මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කළ අවස්ථාවලදී ඔවුන්ට විරුද්ධව විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීමට සහ ඔවුන් සම්බන්ධ කටයුතු කිරීමට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව ශ්‍රී ලංක මානව හිමිකම් කොමිෂන් සභාව වෙත බලතල හිමිවේ.

මේ අනුව කොමිෂන් සභාව විසින් මෙම මැතිවරණ වකවානුවේ නිදහස් හා සාධාරණ මැතිවරණයක් පවත්වාගෙන යාම වෙනුවෙන් රාජ්‍ය නිලධාරීන් තම වගකීම නිසි ලෙස ඉටු කරන්නේ ද යන්න අධීක්ෂණයට ලක් කරනු ඇත. එසේම අවශ්‍ය අවස්ථාවල එම නිලධාරීන්ට එරෙහිව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම යටතේ විමර්ශන හා පරීක්ෂණ සිදු කර පියවර ගැනීමට කටයුතු කෙරේ.

එබැවින් පහත සඳහන් පරිදි ක්‍රියා කරන ලෙසට ඔබ ඇතුලු ඔබ පාලනය යටතේ පවතින ආයතනවල කාර්ය මණ්ඩලයන්ට දැනුම් දෙන ලෙස හා දැනුවත් කරන ලෙසට මෙයින් දන්වා සිටිමු.

- තම සියලු රාජකාරි නීති ප්‍රකාරව ඉටු කළයුතු වේ. කිසිදු දේශපාලන පක්ෂයක් හෝ යම් අපේක්ෂකයෙක් හෝ ප්‍රවර්ධනය කිරීම හෝ අගතියට පත් කිරීම සිදු කෙරෙන ආකාරයේ යම් ක්‍රියාවක් කිරීම හෝ නොකර හැරීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමකි.

- නීති ප්‍රකාරව කටයුතු නොකිරීම, එක් පාර්ශවයකට වාසි සහගත වන අයුරින් බලය අයුතු ලෙස භාවිතා කිරීම(උදා :- මැතිවරණ නීති උල්ලංඝනය කරමින් සමහර දේශපාලන පක්ෂවලට/ කණ්ඩායම් වෙත පොදු දේපල සහ සම්පත් භාවිතා කිරීමට ඉඩ ප්‍රස්ථා ලබාදීම) ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වේ. නීති ප්‍රකාරව කටයුතු නොකිරීම මගින් සිදුවන හිමිකම් උල්ලංඝනයන් පිළිබඳව රජයේ වගකීමට අමතරව එම නිලධරින් පෞද්ගලිකවම වගකීම් දැරිය යුතුය.

මෙම දැන්වීම කරනුයේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව බව සලකන්න.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2024 ජුලි 31

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව